**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ - 2018**

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව , සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාදන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව , වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ආස්ථිත්‍යයට අදාළ වාර්තා පාර්මේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2020 මාර්තු 11 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය, ප්‍රධාන කාර්යාලයීය පරිශ්‍රමික හා බදු ගැලපීමට පෙර ඉකුත් වර්ෂ 5 ක් සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී සමාගමේ දායකත්වය 2012 වසරේ සිට 2017 වර්ෂය දක්වා රු.මිලියන 629 ක ලාභයක සිට රු. මිලියන 212 ක අලාභයක් දක්වා අඩුවී ඇති බව නිරීක්ෂණය විය.

**2.2 අනුපාත විශ්ලේෂණය**

කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සහ බඩල්ගම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය හේතුවෙන් සමාගමෙහි තෝලණ අනුපාතය 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා 0.64 සිට 9.8 දක්වා වැඩිවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනා ගන්නා ලද පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අඹේවෙල කිරි කර්මාන්ත ශාලාවේ නව DESMI යන්ත්‍රාගාරය පිහිටුවීමත් සමඟ කිරි ඝන අපතය වැඩි වී තිබුණි. මෙහිදී පැරණි යන්ත්‍රාගාරයෙහි නිෂ්පාදන වටයක් අවසානයේදී එම යන්ත්‍රාගාරය පිරිසිදු කිරීමේදී ඉවත්වන කිරි, ටැංකියක ගබඩා කර නැවත නිෂ්පාදනයට එකතු කරන නමුත් නව (DESMI) යන්ත්‍රයෙහි එක් නිෂ්පාදන ක්‍රියාවලියක් අවසානයේ පිරිසිදු කිරීමේදී එපරිදි නැවත නිෂ්පාදනයට එකතුකර ගැනීමට ක්‍රමවේදයක් නොතිබූ අතර රු.74,206 ක කිරි ලීටර් 1080 ක් පමණ අපතයක් විය. එම අපතය ඉහළයාම අවම කිරීම සම්බන්ධයෙන් DESMI ව්‍යාපෘතියේ ඉංජිනේරුවන් සමඟ හෝ වෙනත් වගකිවයුතු පාර්ශවයන් සමඟ අදාළ වගකීම් කාලය තුළ අවශ්‍ය පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. (කළමනාකාරිත්වයේ පාලනයෙන් පරිබාහිර හේතු මත මෙම තත්ත්වය ඇති වී ඇත.) | නව DESMI යන්ත්‍රයේ කිරි අපතය ඉහළයාම අවම කිරීමට වගකිවයුතු පාර්ශවයන් ක්‍රියා කල යුතු වීම |
| (ආ) | ඉතිරිවන කිරි නැවත නිෂ්පාදනට යොමු කිරීම සඳහා නව යන්ත්‍රාගාරයට නල පද්ධතියක් සකස් කිරීමට රු.1,020,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් 2018 සැප්තැම්බර් 17 දින විධායක ඉංජිනේරුවරයකු විසින් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අපතය වැළැක්වීම මගින් එම ඇස්තමේන්තුගත පිරිවැය, දින 46 ක් තුල ආවරණය කර ගත හැකි බව දක්වා තිබුනද, නව යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර වර්ෂ 1යි මාස 05 පමණ කාලයක් ඉකුත්ව තිබුනද, අදාළ යෝජනාව පිලිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කර කර්මාන්තශාලාවේ අපතය අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම 2018 දෙසැම්බර් 31 දින දක්වාම සිදු කර නොතිබුණි. | එකඟ නොවියහැකි කරුණු නොමැත. (කළමනාකාරිත්වයේ පාලනයෙන් පරිබාහිර හේතු මත මෙම තත්ත්වය ඇති වී ඇත.) | ඉතිරිවන කිරි නැවත නිෂ්පාදනට යොමු කිරීමට යෝජිත ක්‍රියාමාර්ග සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කර කර්මාන්තශාලාවේ අපතය අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට වගකිවයුතු පාර්ශවයන් ක්‍රියා කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව යන්ත්‍රාගාරයේ නිෂ්පාදනය සඳහා භාවිතා කෙරෙන බොයිලේරුව අක්‍රියවූ විටද එය පිරිසිදු කිරීමේදී වරකට රු. 74,206 ක් වටිනා කිරි ලීටර් 1080 ක් පමණ ඉවත් කරන අතර, බොයිලේරුව අක්‍රීය වීම සලකා බලන ලද නියැදිය වූ 2018 ඔක්තෝබර් මස හා නොවැම්බර් මස යන මාස 2 තුල අවස්ථා 18 කදී අක්‍රිය වී තිබුණි. ඒ අනුව මාස දෙකක දී රු. 1,237,050 වටිනා ලීටර් 18,000 ක් බොයිලේරුව නැවත පිරිසිදු කිරීමේදී අපතයක් වී ඇති බවත් එය වාර්ෂිකව විශාල පාඩුවක් වන අතර එම අසාමාන්‍ය අක්‍රීයවීම අවම කිරීමට 2019 දෙසැම්බර් 31 දක්වාම ක්‍රියාමාර්ග ගෙන නොමැති බවක් නිරීක්ෂණය විය. | එකඟ නොවියහැකි කරුණු නොමැත. (කළමනාකාරිත්වයේ පාලනයෙන් පරිබාහිර හේතු මත මෙම තත්ත්වය ඇති වී ඇත.) | බොයිලේරුව අසාමාන්‍ය අක්‍රීයවීම අවම කර කිරිඅපතය අවම කිරීමට වගකිවයුතු පාර්ශවයන් ක්‍රියා කල යුතු වීම. |
| (ඈ) | කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය යටතේ නව යන්ත්‍රාගාරය සවිකිරීමෙන් පසු 2017 ජුලි මස සිට සිදුකළ කිරිපිටි නිෂ්පාදනය කිලෝග්‍රෑම් 771,652 ක් දෝෂ රහිත බවට පරීක්ෂණගාර වාර්තා නිකුත් කර තිබූ නමුත් 2017 අගෝස්තු මස නිකුත් කළ කිරිපිටි මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබීමෙන් පසු නැවත ගබඩාව වෙත ගෙන්වා ගත් රු.මිලියන475.2 ක් වටිනා කිරිපිටි කිලෝග්‍රෑම් 720,000 ක ප්‍රමාණයකින් 2018 හා 2019 වර්ෂ වලදී සත්ව ආහාර ලෙස විකිණීමෙන් පසු ඉතිරි කිලෝග්‍රෑම් 666,075 ක් 2019 දෙසැම්බර් 31 දිනටත් අඹේවෙල කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | මිනිස් පරිභෝජනයට සුදුසු බවට පූර්ණ නිවැරදි පරීක්ෂාවකින් පසු පමණක් කිරි පිටි වෙළඳ පොළට නිකුත් කළ යුතු වීම. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 26 දින සිට 30 දින දක්වා තොග සමීක්ෂණය අධීක්ෂණය කිරීමේදී ගබඩා ඇසුරුම් ද්‍රව්‍ය, ගබඩාවේ ඇසිරීමේදී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමට හැකිවන ආකාරයට ගබඩා නොකිරීම නිසා තොග යල් පැනීමට අවධානම වැඩි බව නිරීක්ෂණය විය. තවද, භාණ්ඩ පමණට වැඩියෙන් තොගයේ තබාගැනීම, හා විනාශයට පත්වීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කර නොතිබුණි. ගබඩා ලෙජර් කාඩ්වල උපරිම තොග මට්ටම, අවම තොග මට්ටම, යළි ඇණවුම් මට්ටම යනාදිය සඳහන් කිරීමට ඇතත්, එම ප්‍රමාණයන් එහි සඳහන් කිරීමට කටයුතු | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | තොග යල් පැනීම් හා තොග හානි සිදු නොවන ලෙස ගබඩා තොග පාලනය නිසි පරිදි පවත්වාගත යුතුය. |

කර නොතිබුණි. වැඩිදුර නිරීක්ෂණ පහත දැක්වේ.

| | | |
|---|---|---|
| **(ආ) දිගන කිරි කර්මාන්තශාලාව** | | |
| (i) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගබඩාවට ලැබී තිබූ රු.11,045,003ක් වූ නිෂ්පාදිත ද්‍රව්‍ය ඇසුරුම් තොගය භාණ්ඩ සමීක්ෂණය පැවැත්වූ 2018 දෙසැම්බර් 31 දින වන විට භාවිතා කල නොහැකි තත්වයෙන් පැවතියද එම තොගය 2018 දෙසැම්බර් 31 දිනට කර්මාන්තශාලාවේ තොග ඇගයීම් වාර්තා වල හානි වූ තොග ලෙස දක්වා නොතිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | භාවිතා කල නොහැකි තොග, තොග ඇගයීම් වාර්තා වල නිසි පරිදි වාර්තා කර ගිණුම් මගින් නිවැරදි තොග තත්වයන් වාර්තා කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) පාවිච්චියට නොගන්නා රු.326,940 ක් වටිනා යන්ත්‍ර අමතර කොටස් 137 ක්ද රු.350,992 ක් වටිනා වාහන අමතර කොටස් 13 ක් ද, වටිනාකම හඳුනාගත නොහැකි යන්ත්‍ර හා වාහන අමතර කොටස් 75 ක්ද, ගබඩාවේ පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | පාවිච්චියට නොගන්නා කොටස් සම්බන්ධව භාණ්ඩ සමීක්ෂණය සිදු කර සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව ක්‍රියා කල යුතුය. |
| **(ඇ) අඹේවෙල කර්මාන්තශාලාවේ ඉංජිනේරු ගබඩාව සම්බන්ධ නිරීක්ෂණ** | | |
| (i) ඉංජිනේරු ගබඩාවට අයත් තොග සම්බන්ධ වූ නියැදි පරීක්ෂාවේදී 2018 දෙසැම්බර් 31 දිනට රු.7,443,498 වටිනා අයිතම 43 කට අදාල යන්ත්‍ර කොටස් 67 ක් වසර 2 සිට 25 දක්වා කාලයක සිට නිෂ්කාර්යව ගබඩාවෙහි පවතින අතර එම උපකරණ සමාගමෙහි අනෙකුත් කර්මාන්තශාලා සඳහා උපයෝජනයට ගැනීමේ ඇති හැකියාව කොරෙහිද අවධානය යොමු කර නොතිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | අදාළ භාණ්ඩ උපයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 2014 වාර්ෂික තොග ආගණනයේ දී රු. 6,041,166 වටිනාකම වූ තොග අයිතම 2041ක් භාවිතයට ගත නොහැකි ලෙස තීරණය කර තිබූ නමුත් එම තොග අයිතම විගණිත දින වූ 2018 දෙසැම්බර් 18 දින වන විටත් අබලි ද්‍රව්‍ය ලෙස නිෂ්පාදන අංශයට අයත් ගබඩාව තුල ගොඩ ගසා තිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | අදාළ තොග අයිතම අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) ඉංජිනේරු ගබඩාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීමේදී බලයලත් නිලධාරියකුගේ අනුමැතිය මත එක් එක් කාර්ය සඳහා වෙන වෙනම ද්‍රව්‍ය අධියාචනා පත් නිකුත් වන බවට ප්‍රමාණවත් | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | ද්‍රව්‍ය නිකුත් කිරීමේදී ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| | (iv) කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය යටතේ නව යන්ත්‍රාගාරය සවිකිරීමෙන් පසු ඉදිරියේදී භාවිතා කිරීමට ලබා දී ඇති අමතර කොටස් වර්ග කිරීමකින් තොරව සියලු ද්‍රව්‍ය ගබඩාවේ ගොඩගසා තිබූ අතර එම ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රි ලේඛනයකට ඇතුලත් කිරීමට හෝ වෙනත් කිසිදු ලේඛනගත කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රි ලේඛනයකට ඇතුලත් කිරීමට ක්‍රියා කල යුතුය. |
| **(ඇ)** | **අඹේවෙල කර්මාන්තශාලාවේ ඇසුරුම් හා නිමි ද්‍රව්‍ය ගබඩාව** | | |
| | (i) 2018 වර්ෂයතුලදී මේද රහිත කිරිපිටි ඇසුරුම් සඳහා භාවිතා කර තිබූ මුළු පොලිතින් ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 1858 ක් වුවද අවසන් වරට මිලදී ගැනීම් සිදු කල 2018 අගෝස්තු 13 දින අවසානයේ පැවති තොගය කිලෝග්‍රෑම් 21,459 ක් විය. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු.10,413,024 ක් වටිනා කිලෝග්‍රෑම්17,454.88 ක අධි තොගයක් විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | සමාගමට නිවැරදි තොග මට්ටම් ස්ථාපිත කර කාර්යක්ෂමව හා ආර්ථික ලෙස තොග මට්ටම් පවත්වා ගත යුතුය. |
| | (ii) 2016 වර්ෂයට පෙර සිට භාවිතයට නොගන්නා ලද රු. 15,699,277 වටිනා කිරිපිටි ඇසුරුම් (metalized polyandry) කිලෝ ග්‍රෑම් 17,750 ක් හා පොහොර බෑග් 31,000 ක් අඹේවෙල කර්මාන්තශාලාවේ 2018 දෙසැම්බර් 31 දිනට යල්පැන ගිය තොග ලෙස හදුනා ගෙන නොතිබුණි. | | භාණ්ඩ සමීක්ෂණය නිසි පරිදි සිදු කර යල්පැන ගිය තොග හඳුනාගෙන නිසි පරිදි වාර්තා කල යුතුය |
| **(ඉ)** | **අඹේවෙල කර්මාන්තශාලාවේ** බටර් අමුද්‍රව්‍ය ලෙස යොදාගෙන ගිතෙල් නිෂ්පාදනය කරන අතර, 2018 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ බටර් කිලෝග්‍රෑම් 30,000 කින් නිෂ්පාදනය කළ හැකි ගිතෙල් ප්‍රමාණය 24,427 kg වේ. ඒ අනුව මෙම තොග සම්බන්ධයෙන් රු. 23,796,840 ක අලාභයක් දැරීමට සිදුවන නමුත් 2018 දෙසැම්බර් 31 දින දක්වාම එහි වටිනාකම තොග හානි හා පාඩු ලෙස හඳුනාගෙන නොතිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | තොග හානි හා පාඩු නිසි පරිදි හඳුනාගෙන ගිණුම් ගත කිරීම නිසි පරිදි සිදු කල යුතුය. |
| **(ඊ)** | **අඹේවෙල කර්මාන්තශාලාවේ** සාමාන්‍ය තොග ගබඩාවෙහි තොග සමීක්ෂණයේදී තොග පොත් වල | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | තොග හා නිකුත් කිරීම් නිසි පරිදි |

| | | | |
|---|---|---|---|
| | පැවති ශේෂ හා සැසඳීමේදී රු. 601,847 ක් වටිනා අයිතම 03 ක තොග ඌනතාවයක් හා රු.46,752,278 ක් වටිනා අයිතම 05 ක තොග අතිරික්තතාවයක් පැවති අතර මෙම ගබඩාව ආනාරක්ෂිතව අභ්‍යන්තර පාලනයකින් තොරව පවත්වා ගෙන යන බවත් නිෂ්පාදන අංශයෙන් ගබඩාවට ලැබෙන තොග හා නිකුත් කිරීම් නිසි පරිදි ලෙජර් පොත්වල ඇතුලත් කිරීම හා ඒ පිළිබද වගකිවයුතු නිලධාරියෙක් විසින් පරික්ෂා කිරීමේ ක්‍රම වේදයන් නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | | ලෙජර් පොත් තුලට ඇතුලත් කිරීම හා ඒ පිළිබද වගකිවයුතු නිලධාරියෙක් විසින් පරික්ෂා කිරීම කල යුතුය |
| (උ) | **අඹේවෙල කර්මාන්තශාලාවෙහි** බටර් ඇසුරුම් කරන යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා 2018 ඔක්තොම්බර් මාසයේ දී කොළඹ පෞද්ගලික ආයතනයකට භාරදී තිබූ අතර විගණිත දින වූ 2018 දෙසැම්බර් 26 වන විටත් අළුත්වැඩියා කර එම යන්ත්‍රය නැවත භාරදී නොතිබුණි. ඒ අනුව මෙම නිෂ්පාදනය මාස 03 ක කාලයක් නවත්වා තිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 වන විට බටර් කිලෝග්‍රෑම් 12,225 ක් තොග වශයෙන් ඇසුරුම් කිරීමෙන් තොරව පවතින බව නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | කර්මාන්ත ශාලා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව සඳහා ගිවිසුම්ගතව නියමිත කාල වකවානු තුල ඒවා ගෙන්වා ගැනීමට අදාල නිලධාරීන් කටයුතු කල යුතුය. |
| (ඌ) | ඉහත යන්ත්‍රය අළුත්වැඩියා කිරීම ප්‍රමාදවීම නිසා බටර් ග්‍රෑම් 200 ඇසුරුම් සඳහා ඒකක පිරිවැය රුපියල් 8.42 ක් වූ ඇලුමිනියම් ඇසුරුම් වෙනුවට ඒකක පිරිවැය රුපියල් 9.12 ක් වූ ප්ලාස්ටික් ඇසුරුම භාවිත කිරීම සමාගමට අවාසිදායක බව නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | සමාගමට වාසිදායක ලෙස බටර් ඇසුරුම් කිරීමේ ක්‍රමවේදයන් තෝරාගත යුතුය. |
| (එ) | **අඹේවෙල කර්මාන්තශාලාවේ** නව කිරි පිටි යන්ත්‍රාගාරයේ හත්වන මහලේ ඇති කිරි, පිටි බවට පත් කරන වියලනයේ (dryer) ඉහළ සවිකර ඇති නොසල්ස් (nasals) හතර නිෂ්පාදනයෙන් පසුව පිරිසිදු කිරීම සඳහා ගලවා ඉවත් කර, පසු දින නැවත නිෂ්පාදනය ආරම්භ කරන විට එම නොසල්ස් සවි කරන තෙක් වියලනයේ විවරය වසා තැබීමට කටයුතු නොකිරීම නිසා මිනිස් පරිභෝජනයට නුසුදුසු යමක් නිෂ්පාදනයට එකතු වීමේ අවධානමක් ඇති බව නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | සෞඛ්‍ය ආරක්ෂිතව නිෂ්පාදනයන් සිදුවන බවට වගබලාගත යුතුය. |
| (ඒ) | නව කිරි පිටි යන්ත්‍රාගාරයේ සෑම මොහොතේම සේවකයින් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ නිරතව සිටිය ද යම් හදිසි අවස්ථාවකදී පිටවීම සඳහා හදිසි දොරටුවක් මහල් හත සඳහාම | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | ගිණි හානි හා වෙනත් හදිසි ආපදාවලින් ගොඩනැගිල්ල තුල සේවය කරන |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. තවද අඹේවෙල පරිශ්‍රය පුරා තබා ඇති හදිසි ගිණි නිවීම් සඳහා භාවිතා කරන ගිණි නිවීමේ සිලින්ඩරය කල් ඉකුත් වී ඇති අතර ඒවා සේවා කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | | සේවකයන්ගේ හා ස්තාපිත කර ඇති යන්ත්‍ර සූත්‍රවල ආරක්ෂාව සම්බන්ධයෙන් පියවර ගත යුතු වීම. |
| (ඔ) | අක්කර 4 ක පමණ භූමියක ව්‍යාප්තව පවතින ගොඩනැගිලි 4කින් යුතු අඹේවෙල කර්මාන්තශාලාවේ සේවකයින් 234 දෙනෙකු සේවයේ නියුතුව සිටින අතර ඔවුන් හට භාවිතා කිරීම සඳහා ප්‍රමාණවත් හා සුදුසු සනීපාරක්ෂක පහසුකම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ලබාදී නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | කර්මාන්ත ශාලාවේ සේවකයින් සඳහා ප්‍රමාණවත් හා සුදුසු සනීපාරක්ෂක පහසුකම් ලබා දීමට පියවර ගත යුතුය. |
| (ඕ) | අඹේවෙල කිරි කර්මාන්තශාලාව හා දිගන කිරි කර්මාන්තශාලාව සඳහා තොග පොත් පවත්වා නොතිබුණි. | කර්මාන්තශාලාවේ අයිතම විශාල සංඛ්‍යාවක් පවතින බැවින් ලේඛනයක් පවත්වා නොගන්නා අතර ඒ සඳහා බින්කාඩ්පත් භාවිතා කරයි.එසේ ම බින්කාඩ්පත් යාවත්කාලීන කරනුයේ GRN, MRN පත් සැලකිල්ලට ගෙනය. | අභ්‍යන්තර පරීක්ෂාව හා පාලනයට කර්මාන්තශාලාවේ තොග පොත් පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ක) | විදුලි සවි කිරීම් හා උපකරණ පිළිබඳව ලේඛනයක් දිගන කිරි කර්මාන්තශාලාව සඳහා පවත්වා නොතිබුණි. | විධිමත් ලේඛණ ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. | විදුලි සවි කිරීම් හා උපකරණ සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ග) | ඇප තැබිය යුතු සමහරක් නිලධාරීන් ඇප තබා නොතිබුණු අතර ඇප ලේඛනයක්ද පවත්වා නොතිබුණි. | සරප්වරුන් පමණක් දැනට ඇප තැන්පතු ලබාදෙන අතර ඉදිරියේ දී ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයේ දැනුවත් කරන ආකාරයට ඇප තැන්පතු ලබාගැනිමට කටයුතු කරමි. | ඇප තබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ච) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | වත්කම් කලමණාකරණට කටයුතු කල යුතුය. |
| (ජ) | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | කර්මාන්තශාලාවේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සංක්ෂිප්ත පරිගණක වාර්තාවක් යාවත්කාලීන කරන අතර ඉදිරියේදී සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යන්ත්‍රය අක්‍රිය විමට පෙර දිගන කිරි කර්මාන්තශාලාවේ වැනිලා හා චොකලට් කිරි පානය නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත යන්ත්‍රය මගින් 2017 ජුනි සිට 2018 මාර්තු දක්වා මිලි ලීටර් 250 බෝතල් කිරි නිෂ්පාදනයෙන් රු.124,885,082 ක හා මිලි ලීටර් 500 බෝතල් කිරි නිෂ්පාදනයෙන් රු.15,082,405 ක මුළු ආදායමක් උපයා තිබුණද 2018 මාර්තු මස සිට 2019 මැයි 03 වන දින දක්වා එනම් අවු.01 මාස 02 ක කාලයක් යන්ත්‍රය අක්‍රිය වීම හේතුවෙන් සමාගමට ලබා ගැනීමට තිබූ ආදායමක් අහිමිවී තිබූ නිරීක්ෂණය විය. | සැපයුම්කරුගේ ප්‍රමාද දෝෂයකි. | කර්මාන්තශාලා යන්ත්‍ර සූත්‍රවල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු නිසියාකාරව පවත්වා ගනිමින් සමාගමට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට හැකිවන ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 හා 4.2.6 ප්‍රකාරව කාර්යසාධන වාර්තා පිළියෙල කර කාර්තුමය,අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, අදාල අමාත්‍යාංශයට හා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනය විසින් වාර්ෂික වාර්තා සකස් කරන හෙයින් කාර්යයසාධන වාර්තාවක් වෙනම සකස් කිරීම අවශ්‍ය නොවන බව අමාත්‍යාංශයේ විගණනය හා කල රැස්වීමේ දී දැනුම් දී ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව ක්‍රියා කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2018 වර්ෂයට අදාළව සමාගම විසින් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා ඉදිරිපත් කරනු ලැබූ කාර්යසාධන වාර්තාවට අනුව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම මඟින් කිරි ලීටර මිලියන 119.94 ක් එකතු කිරීම සඳහා සැලසුම් කර තිබුණද මෙම වර්ෂය සඳහා සත්‍ය වශයෙන්ම එකතු කර ඇති කිරි ලීටර ප්‍රමාණය මිලියන 91.10ක් වන අතර එය එකතු කිරීමට අපේක්ෂා කරන ලද කිරි ලීටර ප්‍රමාණයෙන් සියයට 76ක් විය. 2017 වර්ෂයේ එකතු කර ඇති කිරි ලීටර ප්‍රමාණය වන මිලියන 96.20 ක් හා සාපේක්ෂව 2018 වර්ෂයේ එකතු කරන ලද කිරි ලීටර ප්‍රමාණය මිලියන 5.11 කින් අඩු බව ද නිරීක්ෂණය විය. | පැවති අයහපත් දේශපාලනික තත්ත්වයේ බලපෑම නිසා දිවයිනේ බොහෝ ප්‍රෙද්ශවල කිරි නිෂ්පාදනය අඩුවී ඇති අතරම මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් කිරිගොවීන්ට කල යුතු ගෙවීම් ප්‍රමාද වීම තුළින්ද යම් අයහපත් බලපෑමක් සිදුවී ඇත. | පවත්නා අභ්‍යන්තර හා බාහිර සාධක මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කළ යුතුය. |
| (ii) ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කළ ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය පරීක්ෂා කර බැලීමේ දී නව ස්වයංපාලිත කිරි ගොවි සමිති ආරම්භ කිරීම සියයට 37 ක්ද, දෛනික කිරි නිෂ්පාදන ධාරිතාවය ලිටර් 200 ක් බැගින් වන ගොවිපල ආරම්භ කිරීම සියයට 41 ක්ද, ස්වයංපාලිත ගොවිපලවල නිලධාරීන් සඳහා එක් දින පුහුණු වැඩමුළු පැවැත්වීම සියයට 41 ක්ද වන ලෙස ක්‍රියාකාරකම්වලට අදාළව වූ ඉලක්කයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සත්‍ය වශයෙන්ම අත්පත් කරගත් ප්‍රමාණය සියයට 50 වඩා අඩු ප්‍රතිශතයක් ගන්නා බව නිරීක්ෂණය විය. | පවතින මූල්‍ය තත්ත්වය අනුව සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත පරිදි සපුරාලීමට නොහැකි විය. | පවත්නා අභ්‍යන්තර හා බාහිර සාධක මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) සමාගමේ කිරි නිෂ්පාදනයන්හි ප්‍රගතිය පරීක්ෂා කර බැලීමේ දී 2017 වර්ෂයට සාපේක්ෂව ජීවානුහරින කිරි නිෂ්පාදනය 2018 වර්ෂයේදී සියයට 19 කින් වැඩිවී තිබූ නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 24 කින් අඩුවී තිබුණි.තවද චීස් නිෂ්පාදනය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 21කින් වැඩිවී තිබූ නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 14 කින් අඩුවී තිබුණි. යෝගට් නිෂ්පාදනය 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 0.4 කින් හා පිටිකිරි නිෂ්පාදනය සියයට 9 කින් අඩුවී තිබුණි. | | අපේක්ෂිත නිශ්පාදන ප්‍රගතිය ලඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණය පියවර ගත යුතුය. |

## 3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 ජුනි 27 දින සමාගම විසින් මිල කැඳවීම් කර 2012 ජනවාරි 31 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ 2013 ජනවාරි 17 දින පුද්ගලික ආයතනයක් සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව රු.12,470,778 ($ 94,500) ක් වටිනා අයිස් ක්‍රීම් යන්ත්‍රයක් හා සවිකිරිම සඳහා රු.214,700 ක් ද වන ලෙස 2013 මැයි 09 වන දිනට සවිකර නිම කිරීමට එකගවී ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණි. පසුව 2014 අප්‍රේල් මස දිගන කර්මාන්තශාලාව වෙත භාරදී තිබූ එම යන්ත්‍රය, විගණන දිනය වූ 2018 දෙසැම්බර් 24 දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | එකඟ නොවියහැකි කරුණු නොමැත. (කළමනාකාරිත්වයේ පාලනයෙන් පරිබාහිර හේතු මත මෙම තත්ත්වය ඇති වී ඇත.) | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමෙන් පසුව පමණක් මිලදී ගැනීම් සිදුවන බවටත් හා අදාළ වත්කම් උපයෝජනය වන බවටත් කළමනාකාරිත්වය වගබලා ගත යුතුය. |
| (ආ) | අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ දෛනිකව බටර් කිලෝ ග්‍රෑම් 3000 ක් පමණ නිෂ්පාදනය කරන පැරණි බටර් නිෂ්පාදන යන්ත්‍රය, නව යන්ත්‍රය ලැබීමෙන් අනතුරුව නිෂ්පාදනයෙන් ඉවත් කර විගණිත දින වූ 2018 නොවැම්බර් 18 දින වන විට වසර 1 1/2 පමණ කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව ඇති බව නිරීක්ෂණය විය . | එකඟ නොවියහැකි කරුණු නොමැත. (කළමනාකාරිත්වයේ පාලනයෙන් පරිබාහිර හේතු මත මෙම තත්ත්වය ඇති වී ඇත.) | භාවිතයෙන් ඉවත් කර ඇති යන්ත්‍රය නැවත භාවිතයට ගැනීමේ හැකියාව සොයාබලා කටයුතු කල යුතු අතර නැතිනම් අදාළ යන්ත්‍රය අපහරණය කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ඇ) | හානි වූ හා නැති වූ වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | හානි වූ වත්කම් හා නැති වූ වත්කම් සම්බන්ධ වෙනම ලේඛනයක් නඩත්තු නොකරයි. | හානි වූ හා නැති වූ වත්කම් වලින් සිදුවූ පාඩු හඳුනා ගෙන අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. |
| (ඈ) | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොමැති අතර නව සංචාරක බංගලා භාරකරුවකු පැමිණි විට හෝ හිටපු භාරකරු සේවයෙන් ඉවත්වූ විට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සහකාර තනතුරේ සේවකයෙකු රාජකාරිය සම්බන්ධ කාර්යසාධන ඇගයීමෙන් පසුව 2018 දෙසැම්බර් 19 වන දිනැති නිවාඩු නිකේතනයේ සියලු වත්කම් ඔහු වෙත ලිඛිතව භාරදීමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර පරීක්ෂාව, පාලනය හා ගිණුම් මගින් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) තොග මට්ටම්, කළමනාකරණය විසින් තීරණය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. කර්මාන්තශාලා ගබඩා පහසුකම් සීමිත අතර ඉදිරියේදි ගබඩා පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරමි. | අතිරික්ත තොග හා තොග හානි වැලක්වීමට තොග මට්ටම්, කළමනාකරණය විසින් තීරණය කල යුතුය. |

## 3.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපාති ආරම්භ කිරිම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 මාර්තු 10 දින මැනුම් කරන ලද පිඹුරු අංක : 4754 අනුව අබේවෙල කර්මාන්තශාලාව පවතින ඉඩම අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අතර එහි සමාගම සතුව රු. මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම් පවතින නමුත් මෙම ඉඩමේ අයිතිය මේ දක්වා සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1998 මාර්තු 07 දින අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඉඩම්වල වසර 50ක බදු අයිතිය ලබා දී ඇත. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් හා ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා කිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 564ක් හා රු.මිලියන 217ක් අයවැය අනුව වෙන්කර තිබුණු නමුත් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ජේදයේ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලසුම් සකස් කල යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ආරක්ෂක සේවාව පුද්ගලික ආයතනයක් මගින් ලබාගෙන තිබූ නමුත් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම කර්මාන්තශාලාවේ කළමනාකරණයෙන් අධීක්ෂණය නොවන අතර එම ආයතනයට සමාගම ගෙවීම් කරනු ලබන්නේ එම ආරක්ෂක අංශය විසින් ඉදිරිපත් කරනු ලබන අත්සන් | එකඟ නොවියහැකි කරුණු නොමැත | අභ්‍යන්තර පාලනය විධිමත්ව පවත්වාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාවක් අනුවය. ඒ අනුව ආරක්ෂක නිලධාරීන් සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් කරගෙන ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ඇතිකිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | මිල්කෝ සමාගමෙහි නාරාහේන්පිට කර්මාන්ත ශාලාවට අදාලව තෝරාගත් නියැදිය වූ සේවකයන් 22 ක් සම්බන්ධයෙන් 2018 අප්‍රේල් මස අතිකාල ගෙවීම පිළිබඳ සිදුකරන ලද පරීක්ෂාවේදී, එම සේවකයන් සත්‍ය වශයෙන් සේවය කල කාලය ඉක්මවා අතිකාල ගෙවීමට කටයුතු කර තිබූ අතර මේ අනුව මසක වැඩිපුර ගෙවීම රු. 383,237 ක් බව නිරීක්ෂණය විය. | රාත්‍රියේ සේවයේ නියුතු සේවකයන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමේ හා මධ්‍යම රාත්‍රිය ඉක්මවා රාජකාරි කළ සේවකයන්ට පසු දින උදෑසන තෙක් විවේක ගැනීමට ඉඩ දී නැවත උදේ වැඩ ආරම්භ කිරීමේ ක්‍රමවේදය මත විගණන විමසුමේ පරිදි අතාත්වික අතිකාල ගෙවීම් කර ඇත. | ගෙවීම් කිරීමේදී වවුචරය සඳහා නිර්දේශය හා අනුමැතිය නිසි පරීක්ෂාවෙන් හා අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ලබාදිය යුතුය. |

**3.8** **වාහන පාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාගමේ ඇති එක් එක් වාහනය වාහන ලොග් සටහන් පොත් පවත්වා ගත යුතු වුවත් දිගන කිරි කර්මාන්තශාලාව සතු වාහන 10 සම්බන්ධයෙන් ලොග් සටහන් පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලොග් සටහන් සපයා ගැනීම සහ පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන ලෙස කළමනාකරණ (ප්‍රවාහන) වෙත උපදෙස් දෙන ලදි. | වාහන නිසි පරිදි කළමණාකරණයට ලොග් සටහන් පොත් පවත්වා ගත යුතුය. |
| (ආ) | වාහන භාර නිලධාරි විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳ විස්තර ද, වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන මෝටර් වාහන ලැයිස්තුවක් තබාගත යුතු වුවත් දිගන කිරි කර්මාන්තශාලාවේ එවැනි වාහන ලැයිස්තුවක් නඩත්තු කර නොතිබුණි. | සමාගම සතු සියලුමවාහන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තා ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශය පවත්වා ගන්නා අතර මෝටර්රථ වාහන ලැයිස්තුව දිගන කර්මාන්තශාලාවේ නොමැත.ඉදිරියේ දී මෝටර්රථ වාහන ලැයිස්තුවේ පිටපතක් සෑම කර්මාන්තශාලාවක් වෙතම ලබාදීමට කටයුතු කරනු ඇත. | ඒ ඒ කර්මාන්තශාලාවයන්හි සිටින වාහන භාර නිලධාරි විසින් තමා භාරයේ ඇති වාහන පිළිබඳ තොරතුරු පවත්වාගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව ව්‍යාපාරික සැලැස්මට ඇතුළත් විය යුතු වර්තමානයේ ආයතනය සතුව පවතින වෙළඳපොළවල් හා සැපයුම්කරුවන් තොරතුරු හා සංවිධාන ව්‍යුහය යන කරුණු 2018-2020 ව්‍යාපාරික සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | සංවිධාන ව්‍යුහය ව්‍යාපාරික සැලැස්මට ඇතුළත් කොට නොමැති අතර ඉදිරි ව්‍යාපාරික සැලැසුම් සකස් කිරිමේදි ඇතුළත් කරනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව සම්පූර්ණ තොරතුරු ඇතුලත්ව සැලැසුම් පිළියෙල කල යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත විය යුතු අයවැය ගත මූල්‍ය තත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය ඇතුළත් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම, යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ වෙනමම සකස් කර ඇත | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |
| (ඇ) | කර්මාන්තශාලාව විසින් ඉංජිනේරු ගබඩා අංශයේ පරිගණකගත කරන ලද තොග කළමනාකරණ මෘදුකාංගයක් 2018 ජනවාරි ස්ථාපිත කර ක්‍රියාත්මක කර තිබූ නමුත් එම පරිගණක මෘදුකාංගයේ තොග ශේෂයේ එදිනට පෙර පැවති තොග ලැබීම් හා නිකුත් කිරීම් පරීක්ෂා කිරීමට පහසුකම් නොවූ අතර තොග මිණුම් ඒකක ද (උදා: ලීටර්, කිලෝග්‍රෑම්, මීටර්) ඇතුළත්ව නොතිබුණි. තවද, තොග අයිතම 103ක එදිනට සෘණ අගයන් ගෙන තිබුණි. ඒ හේතුවෙන් එමගින් ලබාදෙන තොග ශේෂයේ නිරවද්‍යාභාවය පිළිගත නොහැකි තත්ත්වයක පැවතියද එම අඩුපාඩු හදුනාගෙන නිවැරදි කිරීමට 2018 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | මෘදුකාංගයේ ඇති අඩුපාඩු කඩිනමින් යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2003 ජුනි යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අයවැය ලේඛනය පිළියෙල කර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයට අදාළ ප්‍රාග්ධන අයවැය ලේඛනය 2018 මාර්තු 12 දින හා පුනරාවර්තන අයවැය ලේඛනය 2018 මැයි 02 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ 2019 සැප්තැම්බර් 19 දින දීය. | එකඟ නොවිය හැකි කරුණු නොමැත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව නියමිත දිනට අයවැය සකස් කර අනුමත කර නිසි පරිදි අරමුදල් පාලනයට ක්‍රියා කල යුතුය. |
| (ඉ) | ආයතනය විසින් පිළියෙල කර තිබූ ප්‍රාග්ධන අයවැය ලේඛනයේ ඇතුලත් එකතුව රු.මිලියන 392.48ක් වූ මිලදී ගැනීම් හා අලුත්වැඩියා ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | සියලුම වැය ශීර්ෂයන් සඳහා ක්‍රියාකාරි සැළසුම් සකස් කළ නොහැකිය.සංවර්ධන කටයුතු සහ සැළසුම් කරන ලද යන්ත්‍රෝපකරණ /ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් (විශාල පරිමාණයේ ) සඳහා පමණක් ක්‍රියාකාරි සැලැසුම් සකස් කෙරේ. | ප්‍රාග්ධන අයවැය ලේඛනයේ ඇතුලත් කර ඇති වැය ශීර්ෂ ක්‍රියාකාරි සැලැසුමට ඇතුළත් කල යුතුය. |